# 3

# නන්ද වග්ගය

*දිවුලපිටිය, බලගල්ලේ සරස්වතී මහ පිරුවන්පති,*

**පණ්ඩිත, පූජ්‍ය පහළගම ධම්මික ස්ථවිර**

---

පාලි භාෂාවෙහි උදාන ශබ්දය සුවිශේෂ අර්ථයක යෙදෙයි. සාමාන්‍ය අර්ථය ප්‍රීතිය, ප්‍රීති වාක්‍ය යන ලෙස භාෂාවෙහි පරිභාවිත වුවත් බුදුමුවින් නිෂ්පත්තිය ලද උදාන යන්න පිළිබඳ කෝසාට්ඨාකථාගත නිර්වචනයන් විමසීමෙන් එහි පරිභාවිතය පැහැදිලි කර ගත හැකි ය. **"කවර අර්ථයකින් උදාන වී ද? ප්‍රීති වාක්‍ය ප්‍රකාශ කිරීම් අර්ථයෙන් උදාන නම් වේ, ප්‍රීති වාක්‍යය ප්‍රකාශ කිරීම යනු කුමක් ද? සිතෙහි ඇති වූ ප්‍රීති වේගයෙන් ප්‍රකාශ කිරීම යි"**[1] යන ප්‍රශ්නයට පිළිතුරු සපයන උදානට්ඨකථාව සරල උපමාවක් භාවිත කරමින් එය මෙසේ පැහැදිලි කරයි. **"යම් සේ තෙල් ආදී මැණිය යුතු දෙයක් මැණීමට ගැනීමට නො හැකි ය. පිටතට ගලා යයි ද එය ශේෂ වූ දෑ යනුවෙන් කියයි. යම් ජලයක් විලක නොරැඳී පිටතට උතුරා යයි ද එයට ගලායන ජල පහරක් යයි කියයි. එසේ ම ප්‍රීති වේගයෙන් සිතෙහි හටගත් සිතිවිලි පැතිර ගොස් හදවත තුළ රැඳෙන්නට නො හැකි ව උතුරායාම නිසා වාග් ද්වාරයෙන් නිකුත්වන ප්‍රකාශන උදාන යයි කියයි."**[2] **සොම්නස් හා ඥාණසම්පයුත්ත ගාථා උදාන**[3] **නම් වේ. "සොමනස්ස ඤාණමයික ගාථා පතිසංයුත්තා උදාන ලක්ඛණං" යනුවෙන් එහි ලක්ෂණ දක්වයි.** උදාන දේශනා කළ උතුමන් අනුව උදාන වර්ග තුනකි. සර්වඥ භාෂිත උදාන, පච්චේක බුද්ධ භාෂිත උදාන හා ශ්‍රාවක භාෂිත උදාන වශයෙනි.[4] සූත්‍ර පිටතයේ ඛුද්දක නිකාය ග්‍රන්ථ පහළොවක එකතුවකි. එහි තුන්වැනි ග්‍රන්ථය උදාන පාලි වන අතර නවංගසත්ථුසාසන විභජනයෙහි පස්වන අංගය වෙයි.[5] උදාන පාලියෙහි වග්ග අටකි. එනම්, බෝධි වග්ගය, මුචලින්ද වග්ගය, නන්ද වග්ගය, මෙඝිය වග්ගය, සොණ වග්ගය, ජච්චන්ධ වග්ගය, චුල්ල වග්ගය, පාටලිගාමිය වග්ගය යි වග්ග අටකි. සූත්‍ර අසූවකි. ගාථා අනූපහකි. බණවර හතළිස් පහකි.[6] **බුදුරදුන් විවිධ කරුණු තේමාකරගෙන දේශනා කළ උදාන ගාථා අසූවක් උදාන පාලියෙහි ඇතුළත් ය. එම ගාථා සඳහා පළමු සංගායනාවේ දී සකස් කළ නිදාන කථා සමග උදාන පාලිය සංග්‍රහ කොට තිබේ.**

උදාන පාලියෙහි වග්ග දහය අතරින් තුන්වැනි වග්ගය නන්ද වග්ගය යි. මෙම වග්ගයට නන්ද වග්ගය වශයෙන් නම් කර ඇත්තේ මෙම වග්ගයෙහි දෙවැනි නන්ද සූත්‍රය මුල් කරගෙන ය. නන්ද වග්ගයෙහි සූත්‍ර දහයකි. ඒ අතර,

1. කම්ම සුත්ත
2. නන්ද සුත්ත
3. යසොජ සුත්ත
4. සාරිපුත්ත සුත්ත
5. කොලිත සුත්ත
6. පිලින්දවච්ඡ සුත්ත
7. කස්සප සුත්ත

8. පිණ්ඩපාතික සුත්ත

9. සිප්ප සුත්ත

10. ලොකවොලොකන සුත්ත[7]

නන්ද වග්ගයෙහි පළමු සූත්‍රය කම්ම සූත්‍රය යි. පෙර කළ කර්මයෙහි ප්‍රතිවිපාක වින්දනය කළ අයුරු මෙම සූත්‍රයෙන් විස්තර කර දෙයි. මෙම සූත්‍රයෙහි අඤ්ඤතරො භික්ඛු යනුවෙන් ප්‍රකට වූ එක්තරා භික්ෂුවක් කියවේ. උන්වහන්සේ වනාහි රජගහනුවර කුලපුත්‍රයෙකි. උන්වහන්සේ මුගලන් තෙරුන් වහන්සේගෙන් බණ අසා, සංවේගයට පත්වූයේ සසර දොස් දැක, බුදුරදුන් සමීපයෙහි පැවිදි ව, චතු සච්ච කමටහන් ගෙන නොබෝ කලකින් විදර්ශනා වඩා අරහත් බවට පත්වූහ. බුදුරදුන් ධර්මය දේශනා කරන කල්හි පර්යංකයෙන් සමීප ස්ථානයට සිටියේ ය. එහි "අඤ්ඤතරො භික්ඛු නිසින්නො හොති, පල්ලඞ්කං ආභුජිත්වා උජුං කායං පනිධාය පුරාණකම්මවිපාකජං දුක්ඛං තිබ්බං ඛරං කටුකං වෙදනං අධිවාසෙන්තො සතො සම්පජානො අවිහඤ්ඤමානො"[8] මෙහි දී රහත් වූ අත්ත භාවයේ දී පවා පෙර කරන ලද කර්මයෙහි ප්‍රතිවිපාක විඳීමට සිදුවන බව දක්වේ. චෛතසික දුක්ඛයන් නොමැති වුවත් ඉතා දුෂ්කර වූ කායික දුක්ඛයන් ඉවසමින් සිටින ආකාරය දුටු බුදුරදුන් වහන්සේ උදානයක් පහළ කරත්.[9] "දුරු කළ සියලු කර්මයන් ඇති පෙර කරන ලද කර්ම විපාක ඇති මමත්වය නැත්තා වූ නිර්වාණයෙහි පිහිටියා වූ තාදී ගුණයෙන් යුක්ත වූ භික්ෂුවට ජනයාට කීමට කරුණක් නැත." මෙහි දී තදීයට්ඨකථාව 'අම්මස්සා' යන්නට රූපා දී කිසිවක් එහි මම ය මගේ ය යන මමංකාරය නොමැති නිසා ම වෙදුන් විසින් ශරීරය පිළිදැගුම් කිරීමට අනවශ්‍ය වෙයි.[10] තමන්ට ප්‍රතිකාර කිරීමට කරන්න යනුවෙන් ජනයන් ලවා කීම ප්‍රයෝජනය නො වෙයි. ඊට හේතුව මානසික සියලු දුක්ඛයන් නැති කර ඇති බැවින් කර්මානුරූප වේදනාවන් හෙයිනි. එය උපමා කරන්නේ 'ඉදුණු කොළයක් වැටෙන්නා මෙන් තමාගේ කය බිඳී යන්න බව යි."[11] රහත් භාවයේ දී පවා ඇතැම් කර්ම ප්‍රති විපාක දෙන බව නන්ද සූත්‍ර උදානයෙන් පැහැදිලි කරයි.

නන්ද සූත්‍රය මෙම වග්ගයෙහි දෙවැනි සූත්‍රය යි. නන්ද යන නම ඇති මොහු චක්කවත්ති රාජ ලක්ෂණයෙන් යුක්ත විය. සියලු නෑ පිරිවර සතුටුකරවමින් උපන් නිසා නන්ද යන නම ව්‍යවහාර කරන්නට විය. පැවිදි වී ගත කරන දිවිය පිළිබඳ කලකිරී ගිහිබවට පත්වීමට ක්‍රියා කරන බව බුදුරදුන්ට සැලවිය. එහි දී බුදුරදුන් නන්ද හිමියන්ගෙන් ගිහිවීමට තම සිතෙහි උපන් කරුණු විමසා බැලූ විට පෙනී ගියේ ජනපද කල්‍යාණිය නිසා බව යි. එවිට නන්ද හිමියන් සමග තව්තිසා දෙව් ලොවට ගොස්, එහි වසන දේව අප්සරාවන් පෙන්වා, මෙම දේව අප්සරාවන් පිළිබඳ කුමක් සිතන්නේ දැයි විමසූ විට ප්‍රකාශ කරන්නේ ජනපද කල්‍යාණිය කන් නාසාදී දැවී ගිය වැඳිරියන් සේ බව යි.[12] බුදුරදුන් නන්ද හිමියන්ට උපදෙස් දෙන්නේ සසුනෙහි සිත් අලව. මම නුඹ වහන්සේට පරෙවි පා බඳු රතු පැහැයෙන් යුක්ත දේව අප්සරාවන් පන්සීයක් ලබා දීමට ඇපවන බව යි.[13] අනතුරු ව අන්‍ය භික්ෂූන්ගේ වදන් ද සිතට ගෙන වීර්ය වඩා සත්‍යාවබෝධයට පත්විය. මේ පුවත එක්තරා දෙවියෙක් බුදුරදුන්ට දක්වූ හෙයින් උදානයක් පහළ කළහ. "යමෙකු විසින් දෘෂ්ටි නැමැති මඩවගුර හෝ සසර නැමැති මඩවගුර හෝ තරණය කරන ලද ද කෙළෙස් නැමැති කටුව මඩින ලද ද, යමෙක් මෝහය නැසීමට පැමිණියේ ද ඒ භික්ෂුව සුව දුක් දෙකෙහි නො සැලේ."[14] මොහක්ඛයං යන්නෙන් අරහත් බව ප්‍රකාශ වෙයි.[15] මානසික වටපිටාව සුදුසු ආකාරයට ධර්මය අවබෝධකරණය සිදුකිරීම පිළිබඳව නන්ද සූත්‍රයෙන් විශද වෙයි.

මෙම වග්ගයෙහි තෙවන සූත්‍රය යසෝජ සූත්‍රය යි. යසෝජ හිමියන් ප්‍රධාන පන්සියයක් භික්ෂූන් වහන්සේ බුදුරදුන් දැකීම පිණිස සැවැත් නුවරට පිවිසියහ. උන්වහන්සේ නේවාසික

භික්ෂූන් වහන්සේ සමග පිළිසඳරෙහි සතුටු වෙමින් සේනාසන පැණවීම් පාත්‍ර සිවුරු සුරැකි කොට තැබීම් ආදිය සිදු කළහ. එහි දී ඇති වූ ශබ්දය බුදුරදුන් උපමා කරන්නේ "**කෙවට්ටා මඤ්ඤෙ මච්ඡවිලොපෙති**"[16] එහි දී බුදුරදුන් වහන්සේ යසෝජ හිමියන් ප්‍රධාන පන්සියයක් භික්ෂූන් වහන්සේ ආපසු හරවා යවති.[17] එය පිළිගත් මේ භික්ෂූන් වහන්සේ බුදුරදුන් ප්‍රදක්ෂිණා කොට සේනාසන සුරක්ෂිත කොට තබා පාත්‍ර සිවුරු ගෙන වැදෑරටට ගියහ. වග්ගුමුදා නදී තීරයේ පන්සලක් කොට එහි වස් විසූහ. වස්කාලය ඇතුළත සියල්ලෝ ම ත්‍රිවිද්‍යා පසක් කළහ. මේ කාරණය නිමිති කොට ගෙන බුදුරජාණෝ උදානයක් පහළ කළහ.[18] "**යමෙකු විසින් ක්ලේශ කාම නමැති කටුව දිනන ලද්දේ ද ආක්‍රෝශ වධ බන්ධන දිනන ලද්දේ ද ඒ භික්ෂුව පර්වතයක් සේ නොසෙල්වෙමින් සිටියේ වේ ද සුව දුක්හි අකම්පිත නොවේ**" යනුවෙන් දේශනා කළහ. 'කාමකණ්ටක'[19] යනු කුසල පක්ෂය විදින ලද අර්ථයෙන් කාමය කටුවකට උපමා කොට ඇත. බුදුරදුන් ලබාදුන් තීරණය පිළිබඳ ශ්‍රාවකයන් ක්‍රියා කරන ආකාරය හා මානසික දියුණුව තුළින් ධර්මය දකින ආකාරය පැහැදිලි වෙයි.

සාරිපුත්ත හිමියන් බුදුරදුන් සමීපයෙහි සමාධිගත ව වැඩ සිටි අවස්ථාවේ දී උදානයක් පහළ කළහ.[20] "**යම් සේ ගල් පව්වක් නො සෙල් වී මනා සේ පිහිටියේ වේ ද? එසේ භික්ෂුව මෝහක්ෂය වීමෙන් පර්වතයක් සේ නො සෙල්වෙයි.**" මෙහි සඳහන් වන '**මොහක්ඛ**'[21] යන පදයෙන් නිර්වාණය ලැබූ බව කියයි. කොලිත සූත්‍රයෙහි දී මුගලන් හිමියන් සිහිය පිහිටුවා කය අරමුණු කොට වාසය කිරීම දැක බුදුන් වහන්සේ උදානයක් පහළ කළහ.[22] "**යමෙක් කය අරමුණු කොට සිහියෙන් සිටියේ වේ ද? ස්පර්ශයට අරමුණු වූ ෂඩායතනයන් සංවෘත වූයේ නිතර විදර්ශනා සමාධියෙන් සමාහිත වූ භික්ෂුව තමාගේ නිවන දන්නේ**" යන උදානයෙන් තමාගේ ස්කන්ධ පැවැත්මෙහි හේතු අවශේෂ ව නිවන දැනගන්නේ ය. නැවත සිතිය යුත්තක් නොමැති බව මෙහි අදහස වෙයි. පිළින්දවච්ඡ සූත්‍රයෙහි පිළින්දවච්ඡ හිමියන් වසල වාදයෙන් කථා කිරීම පිළිබඳ ව කියැවෙයි. ඒ බව දැනගත් බුදුරදුන් භික්ෂූනට ප්‍රකාශ කරන්නේ පිළින්දවච්ඡ හිමියන් පහත් කොට සිතීම නො කරන්න. උන්වහන්සේ ද්වේශ සහගත සිතින් අන්‍යයන්ට වසල වාදයෙන් කථා නො කරන බවත්, අතීතයෙහි ආත්මභාව පන්සීයක් පුරා ම බමුණු කුලයෙහි ඉපිද වසල වාදයෙන් කථා කොට ඇති බැවින් පූර්ව පුරුද්දට එසේ වසල වාදයෙන් කථා කරන බවත් ය.[23] මේ කාරණය මුල් කරගෙන උදානයක් පහළ කළහ.[24] "**යමෙක් කෙරෙහි මායා නැත්තේ ද මානය නො පවත්නේ ද පහ වූ ලෝභ ඇත්තේ ද මමායනය රහිත ද, ආශා රහිත ද, ක්‍රෝධය මුලිනුපුටා ඇත්තේ ද, නිවුණු සිත් ඇත්තේ ද හෙතෙම බ්‍රාහ්මණ ය, හෙතෙම ශ්‍රමණ ය, හෙතෙම භික්ෂු ය**" යනුවෙනි. "සො බ්‍රාහ්මණො සො සමණො ස භික්ඛු" යන්නෙන් යටපත් කළ පාප ධර්ම ඇති බැවින් බ්‍රාහ්මණ නම් වෙයි. සමනය කළ පාප ඇති බැවින් හා සමාන චර්යා ඇති හෙයින් ශ්‍රමණ නම් වෙයි. සර්වප්‍රකාරයෙන් බිඳින ලද කෙලෙස් ඇති භික්බු නම් වෙයි.[25] පිළින්දවච්ඡ හිමියන් පිළිබඳ පැහැදිලි කිරීම එයින් සූචිත වෙයි. මහාකස්සප හිමියන් සතියක් ඇවෑමෙන් සමාධියෙන් නැගිට පිණ්ඩපාතය සඳහා රජගහනුවරට පිවිසීමට සූදානම් වූ විට පන්සීයක් පමණ දේවතාවෝ මහාකස්සප හිමියන්ට පූජා කිරීමට පැමිණියහ. එහෙත් දෙවියන්ගේ පිණ්ඩපාතය ප්‍රතික්ෂේප කොට රජගහනුවරට පිණ්ඩපාතය සඳහා වැඩියහ. ගෙපිළිවෙළින් පිණ්ඩපාතය වඩින විට ශක්‍රදේවේන්ද්‍රයා පේෂකාර වේෂයක් ගෙන පිණ්ඩපාතය පූජා කළ විට ශක්‍ර දේවේන්ද්‍රයන් බව වටහාගෙන නැවත මෙබන්දක් නොකරන ලෙස කීහ. එවිට ශක්‍ර දේවේන්ද්‍රයන් අපටත් පින් අවශ්‍ය බව කියා මහාකස්සප හිමියන් ප්‍රදක්ෂිණා කොට අහසට නැග "**අහො දානං**

පරම දානං - කස්සපෙ සුප්පතිට්ඨිතං - අහො දානං පරමදානං කස්සපෙ සුප්පතිට්ඨිතන්ති" යනුවෙන් උතුම් දානයකි යනුවෙන් කරන ප්‍රකාශය දැන බුදුන් වහන්සේ උදානයක් පහළ කළහ.[26] එම කස්සප සූත්‍ර උදානයෙන් 'තමා පෝෂණය කරන්නා වූ අන්‍යයකු පෝෂණය නො කරන්නා වූ තාදී වූ උපශාන්ත වූ හැම කල්හි සිහි ඇති පිණ්ඩපාතික භික්ෂුවට දෙවියෝ කැමති වෙති' යනුවෙන් කියනු ලබයි. පිණ්ඩපාතිකාංගය ආරක්ෂා කරන භික්ෂුව පිළිබඳ කරෙරි මණ්ඩලමාලකයට රැස් වූ භික්ෂූන්ගේ කථා සංලාපයක් ඇති විය. 'කරෙරිමණ්ඩලමාල' යන්නෙහි කරෙරි යනු ලුණුවරණ ගසට නමකි. එය ගන්ධකුටි මණ්ඩපයත් ශාලාවත් අතර වෙයි. එහෙයින් ගන්ධකුටිය ද කරෙරියි. කුඩා කුටිය, මණ්ඩපය, ශාලාව යන්නට කරෙරි මාලය යනුවෙන් වවහාර කරන බව අට්ඨකථා මතය වේ.[27] එහි දී පිණ්ඩපාතික භික්ෂුව පිණ්ඩපාතය හැසිරෙන විට මනවඩනා රූප දකින්නට ලැබෙයි. ශබ්ද, ගන්ධ, රස, ස්පර්ශ ආදී පහස විඳීමට හැකි වන බැවින් පිණ්ඩපාතික වීමේ අවශ්‍යතාව පිළිබඳ සිදු කළ කථාවක් සිදුවෙමින් පැවැති අවස්ථාවක ඒ බව දැනගත් බුදුන් වහන්සේ උදානයක් පහළ කළහ.[28] "තමා පෝෂණය කිරීමක් නැති තාදී වූ කීර්ති ප්‍රශංසාවෙහි නො ඇලුණු භික්ෂුවට දෙවියෝ කැමැති වෙති."

නවවැනි සිප්ප සූත්‍රයෙහි දී "කො නු ඛො ආවුසො සිප්පං ජානාති, කො කිං සිප්පං සික්ඛති, කතරං සිප්පං සිප්පානං අග්ගන්ති" යනුවෙන් කවරෙක් ශිල්ප දනී ද? කවරෙක් කුමන ශිල්පයක් උගත්තේ ද? කවර ශිල්පයක් ශිල්ප අතරින් අග්‍ර වේ ද? යන ප්‍රශ්නවලට පිළිතුරු රැසක් ඉදිරිපත් විණි. එකල භාරතීය සමාජයේ පැවැති ශිල්ප පිළිබඳ ව මේ අවස්ථාවේ දී සාකච්ඡාවට ලක්වී ඇති අයුරු දක්නට ලැබේ. බුදුරජාණෝ මේ අවස්ථාවේ දී අවවාද කොට ඒ නිමිති කොට ගෙන උදානයක් පහළ කළහ.[29] එහි දී "සැහැල්ලු පැවැත්මක් ඇති තමහට වැඩ කැමැති ශිල්පයන්ගෙන් ජීවිකාව නො කරන ඉන්ද්‍රියන් හික්ම වූ සියලු කෙලෙස් දුරු කළ, බැඳුණු නිවසක් නැති, ආත්ම දෘෂ්ටිය නැති කළ, ආශා රහිත, මරණය නසා තනි ව හැසිරෙන හෙතෙම භික්ෂු නම් වේ." යනුවෙන් වදාළහ. දහ වැනි ලොකවොලොකන සූත්‍රය බුදුරදුන් වහන්සේ උරුවෙල් දනව්වෙහි නේරඤ්ජා නදී තීරයෙහි බෝධි වෘක්ෂ මූලයෙහි වාසය කරන කල්හි ලොව දෙස බැලූ කල්හි නොයෙක් දුක් පීඩාවලට පත්වන සත්ත්වයන් දැක, ඒ නිමිති කොට ගෙන මෙම උදානය පහළ කළහ.[30] මෙම සූත්‍රයෙහි උදාන ගාථා අටකි. ලෝකය දෙස යථා තත්ත්වයෙන් බැලීම මෙයින් සිදු වී ඇත. නන්ද වග්ගයෙහි උදාන තුළින් නිර්වාණය පැහැදිලි කිරීමට ලක් වී ඇත. නිවනට පත් වීමෙන් අටලෝ දහම කෙරෙහි කම්පා නො වේ. පර්වතයක් සේ අකම්පිත ව වාසය කරන බව පැහැදිලි වෙයි.

---

## ආන්තික සටහන්

1. පරමත්ථදීපනී නම් උදානට්ඨකථා, 2 පිටුව, හේවාවිතාරණ මුද්‍රණ, 1920, තත්ථ උදානන්ති කෙනත්ථෙන උදානං? උදානනත්ථෙන කිමිදං උදානනං නාම? පීතිවෙගසමුට්ඨාපිතො උදාහාරො.

2. - එම - 2 පිටුව. යථාහි යං තෙලාදි මිණිතබ්බවත්ථු මාණ ගහෙතුං න සක්කොති විස්සන්දිත්වා ගච්ඡති තං අවසෙකොති වුච්චති, යඤ්ච ජලං තළාකං ගහෙතුං න සක්කොති අජ්ඣොත්ථරිත්වා ගච්ඡති තං ඔඝොති වුච්චති. එවමෙව යං පීතිවෙගසමුට්ඨාපිතං විතක්ක විප්ඵාරං අන්තොහදයං සන්ධාරෙතුං න සක්කොති සො අධිකො හුත්වා අන්තො අසණ්ඨහිත්වා බහි වචීද්වාරෙන නික්ඛන්තො පටිග්ගාහකනිරපෙක්ඛො උදාහාරවිසෙසො උදානන්ති වුච්චති, සමන්තපාසාදිකා, 16 පි. හේවාවිතාරණ මුද්‍රණ, 1929, සොමනස්සඤාණ මයිකගාථාපටිසංයුත්තා ද්වෙ අසීති සුත්තන්තා, සුමංගලවිලාසිනී.

3. පාලි සිංහල අකාරාදිය, 106 පි. බුද්ධදත්ත හිමි, පොල්වත්තේ, බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, නැදිමාල, නැවත මුද්‍රණ 1998. Pali English Dictionary, 134 p. Davids Rhys, T. W. Stede William, first edition, Delhi, 1993.

4. පරමත්ථදීපනී නම් උදානට්ඨකථා, 2 පි. එවමාදිතයිදං සබ්බඤ්ඤුබුද්ධභාසිතං පච්චෙක බුද්ධභාසිතං සාවකභාසිතන්ති තිවිධං හොති.

5. පරමත්ථදීපනී නම් උදානට්ඨකථා, 3 පි. හේවාවිතාරණ මුද්‍රණ. 1920, තං පනෙතං උදානං විනයපිටකං සුත්තපිටකං අභිධම්මපිටකන්ති තීසු පිටකෙසු සුත්තන්තපිටක පරියාපන්නං දීඝනිකායො මජ්ඣිමනිකායො සංයුත්තනිකායො අඞ්ගුත්තර නිකායො ඛුද්දක නිකායොති පඤ්චසු නිකායෙසු ඛුද්දකනිකාය පරියාපන්නං සුත්තං ගෙය්‍යං වෙය්‍යාකරණං ගාථා උදානං ඉතිවුත්තකං ජාතකං අබ්භුතධම්මං වෙදල්ලන්ති වනවසු සාසනඞ්ගෙසු උදානසඞ්ගහං.

6. - එම - 3 පි. බොධිවග්ගො මුචලින්ද වග්ගො නන්ද වග්ගො මෙඝියවග්ගො සොණවග්ගො ජච්චන්ධවග්ගො චුල්ලවග්ගො පාටලිගාමිය වග්ගො වග්ගතො අට්ඨවග්ගං සුත්තතො අසීතිසුත්තසඞ්ගහං ගාථාතො පඤ්චනවුති උදානගාථාසඞ්ගහං භාණවාරතො අඩ්ඪුනනනමත්තා භාණංවාරා.

7. ඛුද්දක නිකාය 1 කොටස, 194 පි. බුද්ධ ජයන්ති පුනර් මුද්‍රණ. **කම්මං නන්දො යසොජො ච සාරිපුත්තො ච කොලිතො - පිලින්දි කස්සපො පිණ්ඩො සිප්පං ලොකෙන තෙ දසාති.**

8. - එම - 170 පි.

9. - එම - සබ්බකම්මජහස්ස භික්ඛුනො ධුනමානස්ස පුරෙකතං රජං, අමමස්ස ඨිතස්ස තාදිනො අත්ථො නත්ථි ජනං ලපෙතවෙති.

10. පරමත්ථදීඑනී නම් උදානට්ඨකථා, 111 පි. රූපාදීසු කත්ථචි මමන්ති ගහණාභාවතො අමමස්ස මමඞ්කාරරහිතස්ස යස්සහි මමඞ්කාරො අත්ථි සො අත්තසිනෙහෙන වෙජ්ජාදිහි සරීරං පටිජග්ගහාපෙති අරහා පන අමමො තස්මා සො සරීරපටිජග්ගනෙපි උදාසීනධාතුකොව.

11. - එම - 111 පි. සරීරෙ නිරපෙක්ඛභාවතො පණ්ඩු පලාසො විය හි බන්ධනං පමුත්තතො කායො භිජ්ජිත්වා පතතූති.

12. ඛුද්දක නිකාය 1 කොටස, 172 පි. සෙය්‍යාථාපි භන්තෙ පලුට්ඨමක්කටි කණ්ණනාසාඡින්නා.

13. - එම - අභිරම නන්ද අභිරම නන්දස අහං තෙ පාටිභාගො පඤ්ඤන්නං අච්ඡාසතානං පටිලාභාය කකුටපාදානන්ති.

14. - එම - 176 පි. යසස නිතිණ්ණො පඞ්කො ච මද්දිතො කාමකණ්ටකො, මොහක්ඛයං අනුප්පත්තො සුඛදුක්ඛෙසු න වෙධති ස භික්ඛු.

15. පරමත්ථදීපනී නම් උදානට්ඨකථා, 119 පි. එවම්භූතො ච දුක්ඛාදිවිසයස්ස සබ්බස්ස සම්මොහස්ස ඛෙපෙනෙන මොහක්ඛයං පත්තො අරහත්තඵලං නිබ්බාණඤ්ච අනුප්පත්තො.

16. ඛුද්දක නිකාය 1 කොටස, 176 පි. මජ්ඣිම නිකාය 1 කොටස, අංගුත්තර නිකාය 1 කොටස.

17. - එම - 178 පි. ගච්ඡථ භික්ඛවෙ වො පනාමෙමි. න වො මම සන්තිකෙ වත්ථබ්බන්ති.

18. ඛුද්දක නිකාය 1 කොටස, 182 පි.

යස්සජිතො කාම කණ්ටකො
අක්කොසො ච වධො ච බන්ධනඤ්ච
පබ්බතො විය සො ඨිතො අනෙජා
සුඛදුක්ඛෙසු න වෙධති ස භික්ඛු.

19. පරමත්ථදීපනී නම් උදානට්ඨකථා, 125 පි. කුසලපක්ඛවිජ්ඣනට්ඨෙන කණ්ටකභූතො.

20. ඛුද්දන නිකාය 1 කොටස, 182 පි.

යථාපි පබ්බතො සෙලො අචලො සුපතිට්ඨිතො
එවං මොහක්ඛයා භික්ඛු පබ්බතොව න වෙධති.

21. පරමත්ථදීපනී නම් උදානට්ඨකථා, 126 පි. මොහස්ස අනවසෙසප්පහාණ මොහමූලක්කතා ච.

22. ඛුද්දක නිකාය 1 කොටස, 182 පි.

සති කායගතා ඡසු එස්සායතනෙසු සංවුතො

සතතං භික්ඛු සමාහිතො ජඤ්ඤො නිබ්බාණ මත්තනො.

23. - එම - 184 පි. 'අථ ඛො භගවා ආයස්මතො පිලින්දිවච්ඡස්ස පුබ්බේනිවාසං මනසි කරිත්වා භික්ඛු ආමන්තෙසි. මා හො තුම්හෙ භික්ඛවෙ වච්ඡස්ස භික්ඛුනො උජ්ඣායිත්ථ න භික්ඛවෙ වච්ඡො දොසන්තරො භික්ඛු වසලවාදෙන සමුදාචරති වච්ඡස්ස භික්ඛවෙ භික්ඛුනො පඤ්ච ජාතිසතානි අබ්භොකිණ්ණානො බ්‍රාහ්මණ කුලෙ පච්චාජාතානි. සො තස්ස වසලවාදො දීඝරත්තං සමුදාචිණ්ණො තෙනායං වච්ඡො වසලවාදෙන සමුදාචරති.

24. - එම - 184 පි.

යම්හි න මායා වසති න මානො

යො වීතලොභා අමමො නිරාසො

පනුන්නකොධො අභිනිබ්බුතො

සො බ්‍රාහ්මණො සො සමණො සභික්ඛු.

25. පරමත්ථදීපනී නම් උදානට්ඨකථා, 180 පි.

සො බ්‍රාහ්මණො සො සමණො සභික්ඛූති සො එවරූපො ඛීණාසවො සබ්බසො බාහිත පාපත්තා බ්‍රාහ්මණො සො එව සමිතපාපත්තා සමචරියා ච සමණො සො එව ච සබ්බසො භින්නකිලෙසත්තා භික්ඛු නාම.

26. ඛුද්දන නිකාය 1 කොටස, 186 පි.

පිණ්ඩපාතිකස්ස භික්ඛුනො අත්තරහස්ස අඤ්ඤපොසිනො - දෙවා පිහයන්ති තාදිනො උපසන්තස්ස සදා සතිමතො.

27. පරමත්ථදීපනී නම් උදානට්ඨකථා, 135 පි.

කරෙරි මණ්ඩලමාලෙති එත්ථ කරෙරීති වරුණරුක්ඛස්ස නාමං. සො කිර ගන්ධකුටියා මණ්ඩපස්ස සාලායව අන්තරෙ හොති. තෙන ගන්ධකුටිපි කරෙරි රුක්ඛස්ස අවිදූරෙ කතෙ නිසීදනසාලසඞ්කාතෙ මණ්ඩලමාලෙ. සුමංගල විලාසිනී මහාපදාන සුත්ත වණ්ණනා.

28. ඛුද්දක නිකාය 1 කොටස, 190 පි.

පිණ්ඩපාතිකස්ස භික්ඛුනො අත්තහරස්ස අනඤ්ඤපොසිනො - දෙවා පිහයන්ති තාවිනො නො වෙ සද්ද සිලොකනිස්සිතො

29. - එම - 192 පි.

අසිප්පජීවි ලහු අත්ථකාමො යතින්ද්‍රියො සබ්බධි විප්පමුත්තො - අනෙකසාරී අමමො නිරාසො හිත්වා මානං එකචරො ස භික්ඛු.

30. - එම - 192 පි.

අයං ලොකො සන්තාපජාතො ලොකො භවපරෙතො රොගං වදති අත්තනො - යෙ යෙන හි මඤ්ඤති තතො තං හොති අඤ්ඤථා.

